# 2022.04.07 වන දින පෙ.ව. 09.30 ට හපුතලේ ප්‍රාදේශීය සභාවේ නව සභා රැස්වීම් ශාලාවේදී පැවති හපුතලේ ප්‍රාදේශීය සභා මාසික මහා සභා රැස්වීම් වාර්තාව

**පැමිණීම**

| | | |
|---|---|---|
| 1. බී. කන්දසාමි මහතා | - | ගරු සභාපති |
| 2. වයි.එම්.නිමල් අමරසිරි මයා | - | ගරු උපසභාපති |
| 3. සෙල්ලයියා සගාදේවන් මයා | - | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී |
| 4. කේ.එම්. විමලසිරි මයා | - | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී |
| 5. සවරිමුත්තු ප්‍රභාහර් මයා | - | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී |
| 6. මාරප්පන් කන්දසාමි මයා | - | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී |
| 7. එච්.ඒ.ඩී. චාන්දනී මානෙල් කුමාරි මිය | - | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීණී |
| 8. ඊ.එම්. සීගිරි ලංකා ඒකනායක මයා | - | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී |
| 9. කේ.ඒ.සී. කිත්සිරි පෙරේරා මයා | - | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී |
| 10. එල්.එච්. ඉන්දික සම්පත් මයා | - | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී |
| 11. එෆ්. වයලට් රෝස් මහත්මිය | - | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීණී |
| 12. ඩී. සුදත් අරුණඅංජන මයා | - | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී |
| 13. තංගවේලු මහේන්ද්‍රන් මයා | - | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී |
| 14. ජී. ලියෝ කැමිලස් ප්‍රනාන්දු මයා | - | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී |
| 15. ආර්.එම්. අනුලාවතී මල්ලිකා මිය | - | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීණී |
| 16. එම්.ඒ. නිල්මිණී චන්ද්‍රකාන්ති මිය | - | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීණී |
| 17. වේලුසාමී එලීල් අරසි මිය | - | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීණී |
| 18. ආර්.එල්.සුදර්ශන මහතා | - | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී |

## 01.පසුගිය රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම

හපුතලේ ප්‍රාදේශීය සභාවේ 2022.03.14 වන දින පවත්වන ලද මාසික මහ සභාවෙ හි මහ සභා වාර්තාව කියවූවා සේ සළකා සභා සම්මත කිරීම සිදු කරන ලෙස ගරු මූලාසනය විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී. මහේන්ද්‍රන් මහතා විසින් දෙමළ භාෂාවෙන් මුද්‍රණය කරන ලද සභා වාර්තාවෙ හි එතුමන් විසින් යෝජනා අංක 02 යටතේ අදහස් දක්වන ලද හපුතලේ දඹේතැන්න වත්ත මාවුස්සාගොල්ල කොටස නිවාස ව්‍යාපෘතියෙ හි අත්තිවාරම් මට්ටමට ගෙවල් 34 ක් හා ලින්ටන් මට්ටමට ගෙවල් 311 ක් මේ වන විට ඉදි කිරීම් කටයුතු සිදු කර ඇති බව සඳහන් බවත් ලින්ටන් මට්ටමට ගෙවල් 311 නොව එය 31 ලෙස සංශෝධනය විය යුතු බවත් ප්‍රකාශ කළ අතර ගරු ප්‍රාදේශිය සභා උප සභාපති වයි.එම්.නිමල් අමරසිරි මහතා විසින් එකී සංශෝධනයට යටත්ව පසුගිය මහ සභා වාර්තාව සභා සම්මත කිරීම සුදුසු බවට යෝජනා කරන ලද අතර, එම යෝජනාව ජී. ලියෝ කැමිලස් ප්‍රනාන්දු මහතා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව පසුගිය මහ සභා රැස්වීම් වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

## 02. සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන

හපුතලේ ප්‍රාදේශීය ලේකම්තුමන්ගේ 2022-04-01 දිනැති BD/HP/LND.5/ESD 2/RECMN / 2 අංක දරණ ලිපිය මගින් සාමාන්‍යාධිකාරි, ජාතික ජල සම්පාදන මණ්ඩලය - බණ්ඩාරවෙල වෙත පානීය ජලය ලබා ගැනීම සම්බන්ධයෙන් යොමු කරන ලද ලිපිය

## 03. සභාව අමතා එවන ලද සංදේශ, පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන

නැත

## 04. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න.

නැත

## 05. යථා පරිදි කල් දී ඇති යෝජනා

## යෝජනා අංක 01

ඉදිරිපත් කිරීම - ගරු සභාපති බී. කන්දසාමි මහතා

2022 වර්ෂය සඳහා නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුවේ සාමාජික ලෙස පත් කර ගන්නා ලද ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි ඩී. සුදත් අරුණ රංජන මහතා වෙනුවට ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී තංගවේලු මහේන්ද්‍රන් මහතා පත් කර ගැනීමත් , 2022 වර්ෂය සඳහා පරිසර හා සෞඛ්‍ය පහසුකම් කමිටුවේ සාමාජික ලෙස පත් කර ගන්නා ලද ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී තංගවේලු මහේන්ද්‍රන් මහතා වෙනුවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි ඩී. සුදත් අරුණ රංජන මහතා පත් කර ගැනීමත් සුදුසු බව යෝජනා කරන්නී ය.

ස්ථිර කිරීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි ආර්.එල්. සුදර්ශන මහතා

විවාදය

2022 වර්ෂය සඳහා නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුවේ සාමාජික ලෙස පත් කර ගන්නා ලද ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි ඩී. සුදත් අරුණ රංජන මහතා වෙනුවට ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී තංගවේලු මහේන්ද්‍රන් මහතා පත් කර ගැනීමත් , 2022 වර්ෂය සඳහා පරිසර හා සෞඛ්‍ය පහසුකම් කමිටුවේ සාමාජික ලෙස පත් කර ගන්නා ලද ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී තංගවේලු මහේන්ද්‍රන් මහතා වෙනුවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි ඩී. සුදත් අරුණ රංජන මහතා පත් කර ගැනීමත් සුදුසු බව ගරු මූලාසනය විසින් පැහැදිලි කරන ලදී.

ඒ අනුව මෙකී යෝජනාව සඳහා ගරු සභාවේ එකඟතාවය මූලාසනය විසින් විමසන ලද අතර, ගරු මන්ත්‍රී මණ්ඩලය විසින් අත ඔසවා එකඟතාවය පළ කළ හෙයින් එකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 02**

ඉදිරිපත් කිරීම - ගරු සභාපති බී. කන්දසාමි මහතා

2021-11-02 වන දින පැවති මුදල් කමිටු නිර්දේශය මත කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් රජය විසින් ක්‍රියාත්මක කරන ලද සංචරණ සීමා හේතුවෙන් 2021 අගෝස්තු මස හා සැප්තැම්බර් මස රට වසා තබන දිනයන් සඳහා අය කළ යුතු පහත උප ලේඛනයේ සඳහන් වූ කඩකුළී රු.4,064.00 ක් එකී පුද්ගලයන්ගේ ඉල්ලීම මත හපුතලේ ප්‍රාදේශීය සභාවේ බදු නිදහස් කිරීමේ නිර්වචිත ප්‍රතිපත්තිය සැලකිල්ලට ගෙන ආදායමෙන් කපා හැරීමටත් එකී ලැබිය යුතු ආදායම වැය විෂය අංක 309/01 යටතේ ගැළපීම සුදුසු බවත් යොජනා කරන්නී ය.

| **2021- අගෝස්තු/සැප්තැම්බර් මාසවල සංචරණ සීමා පැවති කාලය තුළ කපා හැරිය යුතු මුදල් ප්‍රමාණය -කඩකුලී** | | | | |
|---|---|---|---|---|
| **දියතලාව නව වෙළඳ සංකීර්ණය දෙවන මහළ** | | | | |
| **අනු අංකය** | **නම** | **අය විය යුතු මුදල** | **කපා හැරිය යුතු මුදල(අගෝස්තු 21-31 දක්වා** | **සැප්තැම්බර් මාසය** |
| 01 | පී.එච්.ඩී.එස්.ද සිල්වා | 3000 | 1064 | 3000 |
| | **එකතුව** | | **1064** | **3000** |
| | | | **4064** | |

ස්ථිර කිරීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී. සුදත් අරුණ රංජන මහතා

විවාද

2021-11-02 වන දින පැවති මුදල් කමිටු නිර්දේශය මත කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් රජය විසින් ක්‍රියාත්මක කරන ලද සංචරණ සීමා හේතුවෙන් 2021 අගෝස්තු මස හා සැප්තැම්බර් මස රට වසා තබන දිනයන් සඳහා අය කළ යුතු පහත උප ලේඛනයේ සඳහන් වූ කඩකුළී රු.4,064.00 ක් එකී පුද්ගලයන්ගේ ඉල්ලීම මත හපුතලේ ප්‍රාදේශීය සභාවේ බදු නිදහස් කිරීමේ නිර්වචිත ප්‍රතිපත්තිය සැලකිල්ලට ගෙන ආදායමෙන් කපා හැරීමටත් එකී ලැබිය යුතු ආදායම වැය විෂය අංක 309/01 යටතේ ගැළපීම සුදුසු බවත් ගරු මූලාසනය විසින් පැහැදිලි කරන ලදී.

| **2021- අගෝස්තු/සැප්තැම්බර් මාසවල සංචරණ සීමා පැවති කාලය තුළ කපා හැරිය යුතු මුදල් ප්‍රමාණය -කඩකුලී** |
|---|
| **දියතලාව නව වෙළඳ සංකීර්ණය දෙවන මහළ** |

| අනු අංකය | නම | අය විය යුතු මුදල | කපා හැරිය යුතු මුදල(අගෝස්තු 21-31 දක්වා | සැප්තැම්බර් මාසය |
|---|---|---|---|---|
| 01 | පී.එච්.ඩී.එස්.ද සිල්වා | 3000 | 1064 | 3000 |
| | **එකතුව** | | **1064** | **3000** |
| | | | **4064** | |

ඒ අනුව මෙකී යෝජනාව සඳහා ගරු සභාවේ එකඟතාවය මූලාසනය විසින් විමසන ලද අතර, ගරු මන්ත්‍රී මණ්ඩලය විසින් අත ඔසවා එකඟතාවය පළ කළ හෙයින් එකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 03**

ඉදිරිපත් කිරීම - ගරු සභාපති බී. කන්දසාමි මහතා

හපුතලේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ එළිමහන් ස්ථාන සහ පොදු විනෝදය සඳහා වූ ස්ථාන සැපයීම පාලනය කිරීම සහ ඒවායේ කළමනාකරණය සම්බන්ධව ප්‍රාදේශිය සභාව විසින් සකසන ලද අතුරු ව්‍යවස්ථාව සභා සම්මත කිරීම සුදුසු බව යෝජනා කරන්නී ය.

ස්ථිර කිරීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි ටී. මහේන්ද්‍රන් මහතා

විවාද

හපුතලේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ එළිමහන් ස්ථාන සහ පොදු විනෝදය සඳහා වූ ස්ථාන සැපයීම පාලනය කිරීම සහ ඒවායේ කළමනාකරණය සම්බන්ධව ප්‍රාදේශිය සභාව විසින් සකසන ලද අතුරු ව්‍යවස්ථාව සභා සම්මත කිරීම සුදුසු බව ගරු මූලාසනය විසින් පැහැදිලි කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී. මහේන්ද්‍රන් මහතා අදහස් දක්වමින් පිට පළාත්වලින් භාණ්ඩ ගෙනවිත් අප ප්‍රදේශය තුළ අලෙවි කරන බවත් ඒ සම්බන්ධයෙන් මෙහි සඳහන් බව වැදගත් බවත් සංචාරකයන් සම්බන්ධයෙන් ඩොලර්වලින් ගෙවීම සිදු කිරීමේ දී ඩොලර් 04ක් යනු මේ වන විට වර්තමාන රුපියලෙහි වටිනාකම රුපියල් 300ක් පමණක් වන බැවින් ටිකට්පතෙ හි වටිනාකම රුපියල් 1200.00ක් පමණ වන බවත් සඳහන් කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධයෙන් අදහස් දක්වමින් ලිප්ටන් ෂීට් හි විදේශිකයන් සඳහා අය කරනු ලබන මිල ගණන් ඉහළ අගයක් ගන්නා බැවින් සංචාරකයින්ගේ පැමිණීම මේ වන විට අඩු මට්ටමක පවතින බවත් , මෙම අතුරු ව්‍යවස්ථාව සැකසීම තුළින් එකී කටයුතු පාලනය කළ හැකි බවත් , විදේශික වැඩිහිටියන් සඳහා ඩොලර් 04ක් ලෙස සඳහන් වටිනාකම මේ වන විට

රුපියල් 1200.00ක් පමණ වුව ද ඉදිරියේ දී රුපියලෙහි විනිමය අනුපාතය අනුව මෙය වෙනස් වන බව මෙකී අතුරු ව්‍යවස්ථාවේ සඳහන් කර ඇති බවත් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී. සුදත් අරුණ රංජන මහතා අදහස් දක්වමින් නගරයේ පවත්වනු ලබන විවිධ උත්සව සඳහාත් මෙවැනි නීති ඇතුළත් කරමින් අතුරු ව්‍යවස්ථා සැකසීම සුදුසු බව ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති වයි.එම්.නිමල් අමරසිරි මහතා අදහස් දක්වමින් ෆොක්ස් හිල් සඳහා මෙවැනි අතුරු ව්‍යවස්ථා සැකසීම සිදු කළ හැකිද යන්න විමසන ලදී.එසේම කහගොල්ල වැව රවුම සකසා ඇත්තේ හුදු විනෝදය සඳහා වන බැවින් මෙය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය දැනුවත් කර ඉල්ලීම් සිදු කර පවරා ගැනීමට අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කරන ලෙසත් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධයෙන් අදහස් දක්වමින් ෆොක්ස් හිල් පවත්වනු ලබන්නේ හමුදා සුභ සාධනය හේතුවෙන් බව සඳහන් කර ලිපියක් මාර්ගයෙන් සභාව දැනුවත් කර ඇති බැවින් එය අදාල කර ගත නොහැකි බවත් අතුරු ව්‍යවස්ථාව සැකසීමේ පරමාර්ථය වූයේ ලිප්ටන් ෂීට් මෙන්ම එඩිසම් බංගලාව බවත් සඳහන් කරන ලද අතර කහගොල්ල වැව රවුම අසළ භූමිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය දැනුවත් කර ඉල්ලීම් සිදු කර පවරා ගැනීමට අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කරන බවත් ප්‍රකාශ කරන ලදී.

ඒ අනුව මෙකී යෝජනාව සඳහා ගරු සභාවේ එකඟතාවය මූලාසනය විසින් විමසන ලද අතර, ගරු මන්ත්‍රී මණ්ඩලය විසින් අත ඔසවා එකඟතාවය පළ කළ හෙයින් එකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 04**

<u>ඉදිරිපත් කිරීම - ගරු සභාපති බී. කන්දසාමි මහතා</u>

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්. ප්‍රභාගර් මහතාගේ ඉල්ලීමට අනුව සිලම්බු කලාවෙන් ජයග්‍රහණය කරන ලද පාසල් ළමුන් තිදෙනෙක් ඉන්දියාවට යාම සම්බන්ධයෙන් ආධාර මුදලක් ලබා දෙන ලෙසට මුදල් හා ප්‍රතිපත්ති කමිටුවට යොමු කර ඇති ඉල්ලීම් ලිපියට අනුව එකී සිලම්බු කලාවට අවශ්‍ය උපකරණ ලබා දීමට එක් ළමයෙකුට රු.10,000.00 බැගින් රු.30,000.00 ක් සභා අරමුදලෙන් ලබා දීම ගරු ආණ්ඩුකාරතුමාගේ පූර්ව අනුමැතිය මත සිදු කිරීම සුදුසු බව යෝජනා කරන්නී ය.

<u>ස්ථිර කිරීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී. මහේන්ද්‍රන් මහතා</u>

<u>විවාද</u>

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්. ප්‍රභාගර් මහතාගේ ඉල්ලීමට අනුව සිලම්බු කලාවෙන් ජයග්‍රහණය කරන ලද පාසල් ළමුන් තිදෙනෙක් ඉන්දියාවට යාම සම්බන්ධයෙන් ආධාර මුදලක් ලබා දෙන ලෙසට මුදල් හා ප්‍රතිපත්ති කමිටුවට යොමු කර ඇති ඉල්ලීම් ලිපියට අනුව එකී සිලම්බු කලාවට අවශ්‍ය උපකරණ ලබා දීමට එක් ළමයෙකුට රු.10,000.00 බැගින් රු.30,000.00 ක් සභා අරමුදලෙන් ලබා දීම ගරු ආණ්ඩුකාරතුමාගේ පූර්ව අනුමැතිය මත සිදු කිරීම සුදුසු බව ගරු මූලාසනය විසින් පැහැදිලි කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී. මහේන්ද්‍රන් මහතා අදහස් දක්වමින් ආධාර මුදලක් ලබා දීම සිදු කරනුයේ ගමන් වියදමටද නොඑසේ නම් කුමන ආකාරයේ උපකාරයක් ලෙස ද යන්න විමසීම් සිදු කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි එස් ප්‍රභාගර් මහතා විසින් මේ සම්බන්ධයෙන් අදහස් දක්වමින් එම ළමුන්හට ගමන් වියදම් සඳහා මුදල් ප්‍රමාණවත් බවත් , සිලම්බු කලාව සඳහා ඇඳුම් හා එම කලාව සඳහා අවශ්‍ය සිලම්බු රිටි නොමැති බැවින් ඒවා සපයා ගැනීමට අවශ්‍ය මූල්‍යාධාරයක් ලබා දෙන ලෙස ප්‍රකාශ කරන ලදී.

ඒ අනුව සිලම්බු කලාව සඳහා අවශ්‍ය ඇඳුම් හා එම කලාව සඳහා අවශ්‍ය සිලම්බු රිටි මිලදී ගැනීම සඳහා එක් ළමයෙකුට රු.10000.00 බැගින් ළමුන් තිදෙනා සඳහා රු.30000.00ක් සභා අරමුදලෙන් දැරීම සුදුසු බව ගරු සභාව විසින් තීරණය කරන ලදී.

ඒ අනුව මෙකී යෝජනාව සඳහා ගරු සභාවේ එකගතාවය මූලාසනය විසින් විමසන ලද අතර, ගරු මන්ත්‍රී මණ්ඩලය විසින් අත ඔසවා එකගතාවය පළ කළ හෙයින් එකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 05**

<u>ඉදිරිපත් කිරීම - ගරු සභාපති බී. කන්දසාමි මහතා</u>

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි එස්. සගාදේවන් මහතාගේ ඉල්ලීම පරිදි අඩු ආදායම්ලාභි අංක 18, ග්ලැන්නෝර් වත්ත, හපුතල ලිපිනයේ පදිංචි ජේ. විජේරාණි යන අය හට රු.20000.00ක වෛද්‍යාධාරයක් ලබා දීම ගරු ආණ්ඩුකාරතුමාගේ පූර්ව අනුමැතිය මත සිදු කිරීම සුදුසු බවට මූල්‍ය හි ප්‍රතිපත්ති කමිටුවේ දී සාකච්ඡා කළ අතර මෙකී තීරණය මහ සභාවට ඉදිරිපත් කිරීම සුදුසු බව යෝජනා කරන්නී ය.

<u>ස්ථිර කිරීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි ටී. මහේන්ද්‍රන් මහතා</u>

<u>විවාද</u>

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි එස්. සගාදේවන් මහතාගේ ඉල්ලීම පරිදි අඩු ආදායම්ලාභි අංක 18, ග්ලැන්නෝර් වත්ත, හපුතල ලිපිනයේ පදිංචි ජේ. විජේරාණි යන අය හට රු.20000.00ක වෛද්‍යාධාරයක් ලබා දීම ගරු ආණ්ඩුකාරතුමාගේ පූර්ව අනුමැතිය මත සිදු කිරීම සුදුසු බවට මූල්‍ය හා ප්‍රතිපත්ති කමිටුවේ දී සාකච්ඡා කළ අතර මෙකී තීරණය මහ සභාවට ඉදිරිපත් කිරීම සුදුසු බව ගරු මූලාසනය විසින් පැහැදිලි කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.සුදත් අරුණ රංජන මහතා අදහස් දක්වමින් වර්ෂයකට මන්ත්‍රීවරුන් නියෝජනය කරනු ලබන කොට්ඨාසය සඳහා වෙන්වන ප්‍රතිපාදන මත මෙකී ආධාර මුදල ලබා දීම සුදුසු බවත් මෙවැනි කටයුතු නිසි ක්‍රමවේදයක් මත සිදු විය යුතු බවත් නොඑසේ නම් මන්ත්‍රී මණ්ඩලයට අසාධාරණයක් සිදු වන බවත් ප්‍රකාශ කරන ලදී.

ඒ අනුව මෙකී යෝජනාව සඳහා ගරු සභාවේ එකගතාවය මූලාසනය විසින් විමසන ලද අතර, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි එස්. සගාදේවන් මහතා නියෝජනය කරනු ලබන කොට්ඨාසය සඳහා

වෙන්වන ප්‍රතිපාදන මත මෙකී ආධාර මුදල ලබා දීම සුදුසු බවට ගරු මන්ත්‍රී මණ්ඩලය විසින් අත ඔසවා එකඟතාවය පළ කළ හෙයින් එකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 06**

ඉදිරිපත් කිරීම - ගරු සභාපති බී. කන්දසාමි මහතා

රට තුළ පවතින වත්මන් ආර්ථික ගැටලුකාරී තත්ත්වය හමුවේ ලිපි ද්‍රව්‍ය හිඟතාවය හේතුකොට ගෙන 2022 වර්ෂයේ මැයි මස සිට පවත්වනු ලැබීමට නියමිත මහ සභාවන්ට අදාළ වාර්තාවන් හා අනෙකුත් ලිපි මුද්‍රණය කර ගරු මන්ත්‍රී මණ්ඩලය වෙත බෙදා හැරීම සිදු කළ යුතු බවත් මාසික මහ සභාව පවත්වන දිනට වැඩ කරන දින 04 කට පෙර සියලුම මහජන නියෝජිතයන් වෙත රැස්වීමට අදාළ කැඳවීමේ ලිපිය හා පසුගිය මහ සභා වාර්තාව ලබා දීම සිදු කළ යුතු බව රැස්වීම් කාර්ය පටිපාටික රීතිවල අන්තර් ගත වුවද රට තුළ පවතින කඩදාසි හිඟය මත ඊට විසදුමක් ලෙස ආර්ථිකයෙහි පවතින ගැටලුකාරී තත්ත්වය සමනය වනතුරු එකී වාර්තාවන් හා ඊට අදාල ලිපි විද්‍යුත් මාධ්‍ය- වට්ස්ඇප් හරහා ගරු මන්ත්‍රි මණ්ඩලය වෙත බෙදා හැරීම සුදුසු බව යෝජනා කරන්නී ය.

ස්ථිර කිරීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි ආර්.එල්. සුදරශන මහතා

විවාද

රට තුළ පවතින වත්මන් ආර්ථික ගැටලුකාරී තත්ත්වය හමුවේ ලිපි ද්‍රව්‍ය හිඟතාවය හේතුකොට ගෙන 2022 වර්ෂයේ මැයි මස සිට පවත්වනු ලැබීමට නියමිත මහ සභාවන්ට අදාළ වාර්තාවන් හා අනෙකුත් ලිපි මුද්‍රණය කර ගරු මන්ත්‍රී මණ්ඩලය වෙත බෙදා හැරීම සිදු කළ යුතු බවත් මාසික මහ සභාව පවත්වන දිනට වැඩ කරන දින 04 කට පෙර සියලුම මහජන නියෝජිතයන් වෙත රැස්වීමට අදාළ කැඳවීමේ ලිපිය හා පසුගිය මහ සභා වාර්තාව ලබා දීම සිදු කළ යුතු බව රැස්වීම් කාර්ය පටිපාටික රීතිවල අන්තර් ගත වුවද රට තුළ පවතින කඩදාසි හිඟය මත ඊට විසදුමක් ලෙස ආර්ථිකයෙහි පවතින ගැටලුකාරී තත්ත්වය සමනය වනතුරු එකී වාර්තාවන් හා ඊට අදාල ලිපි විද්‍යුත් මාධ්‍ය- වට්ස්ඇප් හරහා ගරු මන්ත්‍රි මණ්ඩලය වෙත බෙදා හැරීම සුදුසු බව ගරු මූලාසනය විසින් පැහැදිලි කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී. මහේන්ද්‍රන් මහතා අදහස් දක්වමින් මහ සභාවන්ට අදාළ වාර්තාවන් හා අනෙකුත් ලිපි මුද්‍රණය කර ගරු මන්ත්‍රී මණ්ඩලය වෙත විද්‍යුත් මාධ්‍ය- වට්ස්ඇප් හරහා බෙදා හැරීම සිදු කිරීම රීති වලට පටහැනි බවත් , වත්මන් ආර්ථික ගැටලුකාරී තත්ත්වය හමුවේ මේ සඳහා පියවරක් ගත යුතු බැවින් විසඳුමක් ලෙස කැඳවීම් ලිපිය හා න්‍යාය පත්‍රය ගරු මන්ත්‍රී මණ්ඩලය වෙත ලබා දීම සිදු කිරීම සුදුසු බවත් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති වයි.එම්. නිමල් අමරසිරි මහතා අදහස් දක්වමින් වත්මන් ආර්ථික ගැටලුකාරී තත්ත්වය හමුවේ මෙම විසඳුම සුදුසු බවත් අවශ්‍ය මොහොතක පරීක්ෂා කිරීම සඳහා සභා වාර්තාවේ පිටපතක් සභාවේ තිබිය යුතු බවත් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් අදහස් දක්වමින් විද්‍යුත් මාධ්‍ය- වට්ස්ඇප් හරහා බෙදා හැරීම සිදු කිරීම රීති වලට පටහැනි බවත් මෙය තාවකාලික විසදුමක් පමණක් බවත් ලිපි ද්‍රව්‍ය හිඟතාවය මඟ හැරුණු වහාම සභා වාර්තාව පෙර පරිදිම බෙදා හැරීමට කටයුතු සිදු කරන බව ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්. ප්‍රභාගර් මහතා අදහස් දක්වමින් සභා වාර්තා විද්‍යුත් මාධ්‍ය- වට්ස්ඇප් හරහා බෙදා හැරීම සිදු කිරීමේ දී තමාගේ පෞද්ගලික වට්ස්ඇප් අංකය සඳහා යොමු කරන ලෙස ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එල්. සුදර්ශන මහතා අදහස් දක්වමින් පවතින ආර්ථික අර්බුදය හමුවේ මෙය තාවකාලික විසඳුමක් ලෙස යොදා ගැනුන ද මෙය නීත්‍යානුකූල ලියවිල්ලක් බැවින් අවශ්‍ය ඕනෑම විටක භාහිර පාර්ශවයකට ඉදිරිපත් කිරීමට ඇත්තේ මෙකී ලියවිල්ල පමණක් බැවින් හැකි නම් පමණක් සභා වාර්තාව පමණක් හෝ ලබා දීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපතිතුමන් මේ සම්බන්ධයෙන් අදහස් දක්වමින් මෙකී යෝජනාව සභා ගත කරනු ලැබුවේ හුදෙක් අනාගත අවිනිශ්චිතතාවය මත බවත් ලිපි ද්‍රව්‍ය ලබා ගැනීමට හැකියාව පවතී නම් කෙසේ හෝ ගරු මන්ත්‍රී මණ්ඩලය වෙත එකී ලියවිලි ලබා දීමට කටයුතු සිදු කරන බවත් ප්‍රකාශ කරන ලදී.

ඒ අනුව රට තුළ පවතින වත්මන් ආර්ථික ගැටලුකාරී තත්ත්වය හමුවේ ලිපි ද්‍රව්‍ය හිඟතාවය හේතුකොට ගෙන 2022 වර්ෂයේ මැයි මස සිට පවත්වනු ලැබීමට නියමිත මහ සභාවන්ට අදාළ වාර්තාවන් හා අනෙකුත් ලිපි මුද්‍රණය කර ගරු මන්ත්‍රී මණ්ඩලය වෙත විද්‍යුත් මාධ්‍ය- වට්ස්ඇප් හරහා ගරු මන්ත්‍රී මණ්ඩලය වෙත බෙදා හැරීම සුදුසු බවත් එකී සභාවන්ට අදාල කැඳවීම් ලිපිය හා න්‍යාය පත්‍රය පමණක් ලිඛිත මාධ්‍ය හරහා ගරු මන්ත්‍රී මණ්ඩලය වෙත ලබා දීම සුදුසු බවටත් තීරණය විය.

ඒ අනුව මෙකී යෝජනාව සඳහා ගරු සභාවේ එකඟතාවය මූලාසනය විසින් විමසන ලද අතර, ගරු මන්ත්‍රී මණ්ඩලය විසින් අත ඔසවා එකඟතාවය පළ කළ හෙයින් එකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 07**

<u>ඉදිරිපත් කිරීම - ගරු සභාපති බී. කන්දසාමි මහතා</u>

හපුතලේ ප්‍රාදේශීය සභාවෙ හි හිටපු ප්‍රාදේශීය සභා සභාපති - ආර් එම් සෙනවිරත්න බණ්ඩා මහතාගේ නමින් දියතලාව පොදු ක්‍රීඩාංගනය නම් කිරීමත් එම ක්‍රීඩාංගනයෙ හි එතුමන්ගේ පිළිරුවක් නිර්මාණය කිරීමත් සුදුසු බව යෝජනා කරන්නී ය.

<u>ස්ථිර කිරීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී. මහේන්ද්‍රන් මහතා</u>

<u>විවාද</u>

හපුතලේ ප්‍රාදේශීය සභාවෙ හි හිටපු ප්‍රාදේශීය සභා සභාපති - ආර් එම් සෙනවිරත්න බණ්ඩා මහතාගේ නමින් දියතලාව පොදු ක්‍රීඩාංගනය නම් කිරීමත් එම ක්‍රීඩාංගනයෙ හි එතුමන්ගේ පිළිරුවක් නිර්මාණය කිරීමත් සුදුසු බව ගරු මූලාසනය විසින් පැහැදිලි කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.සුදත් අරුණ රංජන මහතා අදහස් දක්වමින් ක්‍රීඩා පිට්ටනිය මේ වන විට අංග සම්පූර්ණ වී නොමැති බැවින් සියලු වැඩකටයුතු නිම වීමෙන් පසු මේ සම්බන්ධයෙන් තීරණයක් ලබා ගැනීම සුදුසු බවත් පිළිරුවක් නිර්මාණය කිරීමට නම් සියලු වැඩ නිම විය යුතු බවත් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එල්. සුදර්ශන මහතා අදහස් දක්වමින් දේශපාලාඥයෝ කුමන සේවාවක් සිදු කළ ද මෙය ජනතා මුදලින් සිදු කළ සංවර්ධන කටයුත්තක් බැවින් නම යෙදීම නුසුදුසු බවත් පැවත එන මෙම සංස්කෘතිය වෙනස් කළ යුතු බවත් ප්‍රකාශ කළ අතර ගරු උප සභාපතිතුමන් ද මේ සම්බන්ධයෙන් තම විරුද්ධත්වය ප්‍රකාශ කළ අතර මෙකී යෝජනාව පසුව සභාවට ඉදිරිපත් කිරීම සුදුසු බවත් මෙම අවස්ථාවේ අනවශ්‍ය ප්‍රශ්නයක් බවත් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී. මහේන්ද්‍රන් මහතා අදහස් දක්වමින් බොහෝ ක්‍රීඩාංගනය සඳහා නම් තබා ඇති බවත් ප්‍රතිපාදන වෙන් කිරීමේදී ගැටලුවකින් තොරව ප්‍රතිපාදන ලබා ගැනීමට හැකියාව ලැබෙන බවත් , ඊළඟ සභා වාරයේ දී තමා මෙම යෝජනාව සභාවට ඉදිරිපත් කරන බවත් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපතිතුමන් මේ සම්බන්ධයෙන් අදහස් දක්වමින් තමා මෙම ක්‍රීඩා පිට්ටනිය සංවර්ධනය කිරීමේ දී අවස්ථා ගණනාවකදී කටයුතු සිදු කළද එකී කටයුතු මඟ හැරුණද තමා මහන්සි වී කෙසේ හෝ මෙවර සංවර්ධනය කිරීම සිදු කරන ලද බවත් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි ඊ.එම්. සීගිරි ලංකා ඒකනායක මහතා අදහස් දක්වමින් මෙම ක්‍රීඩා පිට්ටනිය සඳහා නමක් යෝජනා කර තබා ගැනීම සුදුසු බවත් පිළිරුවක් තැනීමේ යෝජනාව පසුවට කල් දැමීම සුදුසු බවත් ප්‍රකාශ කරන ලදී.

ඒ අනුව මෙකී යෝජනාව සඳහා ගරු සභාවේ එකඟතාවය මූලාසනය විසින් විමසන ලද අතර, ගරු මන්ත්‍රී මණ්ඩලය විසින් එකඟතාවය පළ නොකළ හෙයින් එකී යෝජනාව සභා සම්මත නොවීය.

**යෝජනා අංක 08**

ඉදිරිපත් කිරීම - ගරු සභාපති බී. කන්දසාමි මහතා

2022 මැයි මස මහ සභාව පැවැත්වෙන දිනය තීරණය කිරීම සුදුසු බව යෝජනා කරන්නී ය.

ස්ථිර කිරීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි ඩී. සුදත් අරුණ රංජන මහතා

විවාද

2022 මැයි මස මහ සභාව පැවැත්වෙන දිනය ලෙස 2022-05-12 වන බ්‍රහස්පතින්දා දිනය තීරණය කිරීම සුදුසු බව ගරු මූලාසනය විසින් පැහැදිලි කරන ලදී.

ඒ අනුව මෙකී යෝජනාව සඳහා ගරු සභාවේ එකඟතාවය මූලාසනය විසින් විමසන ලද අතර, ගරු මන්ත්‍රී මණ්ඩලය විසින් අත ඔසවා එකඟතාවය පළ කළ හෙයින් එකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## **ගරු මන්ත්‍රී මණ්ඩලය විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා**

**යෝජනා අංක 01**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්. සගාදේවන් මහතා**

ග්ලැන්නොර් වතු රෝහලේ වෛද්‍යවරුන් හිඟ වීම සම්බන්ධයෙන් අදාල පාර්ශව දැනුවත් කිරීම සුදුසු බව යෝජනා කරන්නී ය.

ස්ථිර කිරීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී. සුදත් අරුණ රංජන මහතා

විවාද

ග්ලැන්නොර් වතු රෝහලේ වෛද්‍යවරුන් හිඟ වීම සම්බන්ධයෙන් අදාල පාර්ශව දැනුවත් කිරීම සුදුසු බවත් මේ සම්බන්ධයෙන් රෝහල් කමිටුවක් පත් කිරීමට කටයුතු කිරීම සුදුසු බවත් ගරු මූලාසනය විසින් පැහැදිලි කරන ලදී.

ඒ අනුව මෙකී යෝජනාව සඳහා ගරු සභාවේ එකඟතාවය මූලාසනය විසින් විමසන ලද අතර, ගරු මන්ත්‍රී මණ්ඩලය විසින් අත ඔසවා එකඟතාවය පළ කළ හෙයින් එකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 02**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්. සගාදේවන් මහතා**

ග්ලැන්නොර් - බෝව දක්වා ඇති මාර්ගය සංවර්ධනය කිරීම සම්බන්ධයෙන් අදාල පාර්ශව දැනුවත් කිරීම සුදුසු බව යෝජනා කරන්නී ය.

ස්ථිර කිරීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී. සුදත් අරුණ රංජන මහතා

විවාද

ග්ලැන්නොර් - බෝව දක්වා ඇති මාර්ගය සංවර්ධනය කිරීම සම්බන්ධයෙන් අදාල පාර්ශව දැනුවත් කිරීම සුදුසු බව ගරු මූලාසනය විසින් පැහැදිලි කරන ලදී.

ඒ අනුව මෙකී යෝජනාව සඳහා ගරු සභාවේ එකඟතාවය මූලාසනය විසින් විමසන ලද අතර, ගරු මන්ත්‍රී මණ්ඩලය විසින් අත ඔසවා එකඟතාවය පළ කළ හෙයින් එකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 03**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්. සගාදේවන් මහතා**

2011 වසරේ ආරම්භ කරන ලද ඉන්දියන් නිවාස ව්‍යාපෘතිය යටතේ නිවාස 40ක් සඳහා විදුලිය ලබා ගැනීම සම්බන්ධයෙන් අදාල පාර්ශව දැනුවත් කිරීම සුදුසු බව යෝජනා කරන්නී ය.

ස්ථිර කිරීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී. සුදත් අරුණ රංජන මහතා

විවාද

2011 වසරේ ආරම්භ කරන ලද ඉන්දියන් නිවාස ව්‍යාපෘතිය යටතේ නිවාස 40ක් සඳහා විදුලිය ලබා ගැනීම සම්බන්ධයෙන් අදාල පාර්ශව දැනුවත් කිරීම සුදුසු බව ගරු මූලාසනය විසින් පැහැදිලි කරන ලදී.

ඒ අනුව මෙකී යෝජනාව සඳහා ගරු සභාවේ එකඟතාවය මූලාසනය විසින් විමසන ලද අතර, ගරු මන්ත්‍රී මණ්ඩලය විසින් අත ඔසවා එකඟතාවය පළ කළ හෙයින් එකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 04**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වී. මහේන්ද්‍රන් මහතා**

දඹේතැන්න, බණ්ඩාරඑළිය ප්‍රදේශයේ පිහිටා ඇති **භාරදි** පෙර පාසලේ ළමුන් 54 දෙනෙකු සඳහා අවුරුදු උත්සවය නිමිති කොට පොත් කට්ටලයක් ලබා දීම සඳහා රු.5000.00ක මූල්‍යාධාරයක් ලබා දීම සුදුසු බව යෝජනා කරන්නී ය.

ස්ථිර කිරීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී. සුදත් අරුණ රංජන මහතා

විවාද

දඹේතැන්න, බණ්ඩාරඑළිය ප්‍රදේශයේ පිහිටා ඇති **භාරදි** පෙර පාසලේ ළමුන් 54 දෙනෙකු සඳහා අවුරුදු උත්සවය නිමිති කොට පොත් කට්ටලයක් ලබා දීම සඳහා රු.5000.00ක මූල්‍යාධාරයක් ලබා දීම සුදුසු බව ගරු මූලාසනය විසින් පැහැදිලි කරන ලදී.

ඒ අනුව මෙකී යෝජනාව සඳහා ගරු සභාවේ එකඟතාවය මූලාසනය විසින් විමසන ලද අතර, ගරු මන්ත්‍රී මණ්ඩලය විසින් අත ඔසවා එකඟතාවය පළ කළ හෙයින් එකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 06. කාරක සභා වර්තාව

2022.04.01 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටු වාර්තා සභාව වෙත ඉදිරිපත් කරන ලද අතර, ඒ සඳහා ගරු සභාවේ එකඟතාවය ලැබිණි.

## 07. ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ

2022 අප්‍රේල් මස ලැබීම් හා වියදම් පිළිබඳ මාසික වාර්තාව සභාව වෙත ඉදිරිපත් කරන ලද අතර, ඒ සඳහා ගරු සභාවේ එකඟතාවය ලැබිණි.

## 08.වෙනත් කරුණු

අඩු ආදායම්ලාභී ජනතාවට අත්‍යවශ්‍ය භාණ්ඩ 2020 ජනවාරි මිලට ලබා දෙන ලෙස ඉල්ලීම සඳහා 2022 මාර්තු මස 18 වන දින නිදහස් වෙළඳ කලාප සහ පොදු සේවා සේවක සංගමය විසින් යොමු

කර ඇති ලිපිය ප්‍රකාරව එය සභා ගත කළ බවට අදාළ පාර්ශව දැනුවත් කිරීමට කටයුතු සිදු කරන බව ගරු සභාපතිතුමන් විසින් ප්‍රකාශ කරන ලදී.

**08.1 ගරු මන්ත්‍රීවරුන්ගේ නිවාඩු**

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ආර්.එම්. ඉන්ද්‍රතිලක රාමනායක මහතා ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.ඒ. චන්දන කිත්සිරි පෙරේරා මහතා සහ ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ගෝපාලන් මුරුගන් මහතා අසනීප නිවාඩු ලබා ඇති බැවින් 2022-04-07 වන දින සභාවට සහභාගී නොවීම සම්බන්ධයෙන් ගරු සභාව විසින් එකී සභිකයන් හට අසනීප නිවාඩු ලබා දීම සුදුසු බවට එකඟතාවය පළ කරන ලදී.

ගරු මූලාසනයේ අවසර පරිදි ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි ජී.ලියෝ කැමිලස් ප්‍රනාන්දු මහතා සහ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ආර්.එම්. අනුලාවතී මල්ලිකා මහත්මිය පෙ.ව.10.30ට පමණ සභාවෙන් නික්ම යන ලදී.

**08.2 ගරු මන්ත්‍රීවරුන්ගේ අදහස් දැක්වීම.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී. සුදත් අරුණ රංජන මහතා අදහස් දක්වමින් පොළ භූමිය ඉදිරිපිට ත්‍රී රෝද නතර කිරීම සඳහා කිසිසේත් අවසර ලබා නොදිය යුතු බව ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපතිතුමන් මේ සම්බන්ධයෙන් අදහස් දක්වමින් දියතලාව මධ්‍ය විද්‍යාලය සඳහා පාසල් ළමුන් රුගෙන එනු ලබන පාසල් රථ එකී මාර්ගය දෙපස නවතා තැබීමට පිළියමක් ලෙස තාවකාලිකව පොළ භූමියෙ හි ගාල් කිරීම මේ වන විට සිදු කළ ද දියතලාව නගර මධ්‍යයේ ඔසුසල ආසන්නයේද දැඩි වාහන තදබදයක් පවතින බැවින් ත්‍රීරෝද රථ ගාල වෙනත් ස්ථානයකට මාරු කිරීමට සභා යෝජනාවක් ලබා ගත යුතු බව ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ර්.එම්. සීගිරි ලංකා ඒකනායක මහතා අදහස් දක්වමින් දියතලාව නගරය සඳහා පැමිණෙන මගී ජනතාව හදිසියක දී හෝ වාහනයක් නතර කිරීමට ත්‍රී රෝද රථ රියදුරන් අවස්ථාව ලබ නොදෙන බවත් අසභ්‍ය වචන භාවිතා කරමින් බැන වදින බවත් මෙය ඉතා පහත් ක්‍රියාවක් බවත් පෙන්වා දෙන ලද අතර පොළ භූමිය ප්‍රදර්ශන සඳහා කුලියට ලබා ගත හැකිද යන්න විමසන ලදී.

ගරු සභාපතිතුමන් අදහස් දක්වමින් පොළ භූමිය ප්‍රදර්ශන සඳහා කුලියට ලබා දීමට ඉදිරියේ දී කටයුතු සිදු කරන බව ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිණී එච්. ඒ. ඩී. වාන්දනී මානෙල් කුමාරි මහත්මිය අදහස් දක්වමින් කහගොල්ල පන්සල (ආරාමය) අසල ත්‍රී රෝද රථ ගාලෙහි රියදුරෙකු පසුගිය දිනක බීමත්ව ඉතා අශෝභන ලෙස හැසිරුණ බවත් මේ සම්බන්ධයෙන් පියවර ගත යුතු බවත් , තාවකාලිකව හෝ එවැනි පුද්ගලයන් ඉවත් කිරීමට කටයුතු සිදු කළ යුතු බවත් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපතිතුමන් මේ සම්බන්ධයෙන් අදහස් දක්වමින් එකී ත්‍රී රෝද රථ සංගමයේ සභාපතිතුමන් මේ සම්බන්ධයෙන් දැනුවත් කිරීමට කටයුතු සිදු කළ යුතු බවත් එවැනි ක්‍රියා තව දුරටත් සිදු වන්නේ නම් එකී රථ ගාල ඉවත් කිරීමට කටයුතු සිදු කරන බවත් අදාළ පාර්ශව දැනුවත් කරන ලෙස ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී. මහේන්ද්‍රන් මහතා අදහස් දක්වමින් හපුතලේ ප්‍රාදේශීය සභාව හරහා පසුගිය දිනයන්හිදී සියලුම ග්‍රාම සේවා වසම් ආවරණය වන පරිදි විෂබීජහරණ යන්ත්‍ර බෙදා හරින ලද බවත් ඒ සම්බන්ධයෙන් ප්‍රාදේශීය සංවර්ධන සහයක ව්‍යාපෘතිය භාර ආයතන ප්‍රධානී ඇතුලු කාර්ය මණ්ඩලයට බෙහෙවින් ස්තූතිවන්ත වන බවත් ප්‍රකාශ කරන ලදී.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී. මහේන්ද්‍රන් මහතා තව දුරටත් අදහස් දක්වමින් සිංහල - හින්දු අලුත් අවුරුදු සමයේ දී දියතලාවෙ හි ෆොක්ස් හීල් තරඟ පවත්වනු ලැබුවහොත් එය නැරඹීම සඳහා පිට පළාත්වලින් පැමිණෙන්නන් හේතුවෙන් නගරය තුළ කුණු කසළ එක් රැස් වන බවත් බොහෝ පිරිසක් කහගල්ල ආර් ආර් කන්ස්ට්‍රක්සන් පිහිටි ස්ථානයේ හා වයි හංදිය අසළ වාහන ගාල් කර තැබීම සිදු කරන බැවින් ඒ සඳහා සභාවට ආදායමක් ඉපයිය හැකි බවත් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්. ප්‍රභාගර් මහතා අදහස් දක්වමින් වතුකරයේ එළවලු වගා කරනු ලබන ගොවීන් වර්තමාන ආර්ථිකය තුළ පවතින ගැටලුකාරී තත්ත්වය හමුවේ දඹුල්ල හා කොළඹ යන ප්‍රදේශවලට එළවලු රැගෙන නොයෑම හේතුවෙන් එළවලු අලෙවි කර ගැනීමේ දී ගැටලුවලට මුහුණ දී ඇති අතර හපුතල වත්ත පදිංචි පුද්ගලයෙකු හපුතලේ - කොළඹ ප්‍රධාන මාර්ගයේ එළවලු විකුණා ගැනීම සඳහා එළවලු තට්ටුවක් සාදා ඇති අතර මාර්ග සංවර්ධන අදිකාරිය මෙය අනවසර ඉදිකිරීමක් යැයි සලකා එය ඉවත් කර ගන්නා ලෙස දැනුම් දී ඇති අතර ප්‍රජාවගේ මුහුණ දී ඇති අසරණභාවය හමුවේ මෙකී ප්‍රජාවට තාවකාලික එළවලු කුටි සාදා ගැනීමට අවසර ලබා දෙන ලෙස ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපතිතුමන් මේ සම්බන්ධයෙන් අදහස් දක්වමින් මෙය ප්‍රාදේශීය සභා සීමවට අයත් ප්‍රදේශයක් නොව නගර සභා සීමාවට අයත් ප්‍රදේශයක් වන බැවින් ඒ සඳහා හපුතලේ නගර සභාව හරහා වෙළඳ බලපත්‍රයක් ලබා ගැනීම සඳහා කටයුතු සිදු කරන ලෙස ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්. එල් . සුදර්ශන මහතා අදහස් දක්වමින් දිගින් දිගටම සභාව හරහා දියතලාව දොඩම් වත්ත මාර්ගයෙහි පවතින ගැටලුව පිළිබඳව කරුණු ඉදිරිපත් කළ නමුත් මේවන තුරු එකී ගැටලුව සඳහා විසඳුමක් ලැබී නොමැති බවත් මෙම දිනවල පවතින වර්ෂාව හේතුවෙන් පස් සේදී යාම නිසා මාර්ගය අඩි 02ක් පමණ යට වන බවත් ඒ හේතුවෙන් ප්‍රජාව බෙහෙවින් අපහසුතාවයට ලක් වන බැවින් කොන්ත්‍රාත්කරු හෝ මාර්ග සංවර්ධන අධිකාරිය හෝ දැනුවත් කර ඒ සඳහා තාවකාලික හෝ විසඳුමක් ලබා දෙන ලෙස ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධයෙන් අදහස් දක්වමින් දියතලාව දොඩම් වත්ත මාර්ගයෙහි පවතින ගැටලුව සම්බන්ධයෙන් තාවකාලිකව හෝ විසඳුමක් ලබා දීමට කටයුතු සිදු කරන බව ප්‍රකාශ කරන ලදී.

මෙදින සභා රැස්වීම ප.ව.12.00ට අවසන් විය.

බී. කන්දසාමි,
සභාපති,
හපුතලේ ප්‍රාදේශීය සභාව,
දියතලාව.